15 03 2025

හිතවත් සාලිය

පවත්වන ලද සාකච්ඡාව හා බැදේ.

අප වෙත ලබා දුන් මාතෘකාව

**"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රී ලංකා ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මහතා (ඉතාමත් සත්භාවයෙන්) මුළුමනින්ම ඔහුගේ උපදේශකවරුන්ගෙන් සහ ඉතාම සමීප මිතුරන්ගෙන් මුළු ලෝකයක් ඉදිරියේ හෑල්ලු වීම වළක්වා ගැනීමට ගන්නා උපාය මාර්ග (Strategies) මොනවාද?"**

තේමාව : හෑල්ලු වීම

| යොමු අංකය | හෑල්ලු වීම | වළක්වා ගැනීම | උපාය මාර්ග (Strategies) |
|---|---|---|---|
| SaliyaT/15032025/01 | ව්‍යවස්ථාදායක සභාවල මහජන අපේක්ෂිත අභිප්‍රායන් | දැනට ක්‍රියාත්මක වන සාමාජිකයින්ගේ ක්‍රියා කලාපය කිසිසේත්ම සෑහීමකට පත්විය නොහැක. ඔවුන්ගේ ඉලක්ක මහජන අභිප්‍රායන් සාක්ෂාත් කිරීම දැයි ප්‍රශ්න සහගතය. | දේශපාලන රාමුවකට යටත් නොවන විද්වත් මණ්ඩලයක් මගින් ව්‍යවස්ථාදායක සභාවල ToR (Terms of reference) මුළුමනින්ම නැවත කෙටුම්පත් කළ යුතුය. පුළුල් විද්‍යුත් විසඳුම් ආශ්‍රිතව ඔවුන්ගේ කාර්ය භාරය සිදුවනවාද? නැද්ද? යන්න නිරන්තරයෙන් සොයා බැලීමට ක්‍රමවේදයක් සකසන ලෙස නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| SaliyaT/ 150320 25/02 | දැනට බලපවත්වන බහුතර පනත් කෙටුම්පත් වසර සියයකටත් වඩා පැරණි ඒවා වන එබැවින් කාලීන සංශෝධන ඇතුළත් කිරීම තුළින් යල් පැනගිය පනත් කෙටුම්පත් වර්තමානයට ගැලපෙන පරිදි නවීකරණය | පනත් කෙටුම් පතක් යනු නීතියයි. එහි දුර්වල තැන්වල වාසිය ලබා ගන්නේ රජයේ ඉහළ නිලධාරීන්ගේ ද සහාය ඇතිව දේශපාලඥයෝ ය. | විෂය භාර අමාත්‍යවරු ඒ පිළිබඳව අවධානයක් කරන බව නිරීක්ෂණය නොවේ. විද්වත් කමිටුවල නිර්දේශ රාජ්‍ය පාලනය කෙරෙහි ලබා ගැනීමක් දක්නට නොලැබේ. ඉහළ ප්‍රමුඛතාවයෙන් ක්‍රියාකළ යුතු කර්තව්‍යයකි. |
| SaliyaT/ 150320 25/03 | යෝජිත විධායක නිලධාරීන් පත්කිරීමේ දී අත්‍යවශ්‍ය වන ToR Terms of Reference යාවත්කාලීන කිරීම. | වහ වහා නැවත ප්‍රතිස්ථාපනය කළ යුතුය. | මානව සම්පත් කළමනාකරණයෙහිදී අනුගමනය කරන මූලික විධිධාන මත කුමන හෝ දේශපාලන පක්ෂයක ඒ ඒ විෂය ක්ෂේත්‍රය පිළිබඳව නිපුණත්වයක් දරන මෙතෙක් නොකැළැල් චරිතයක් ඇති රාජ්‍ය හෝ පෞද්ගලික සේවයේ නිලධාරීන් විධිමත් රුකියා පූර්ව සේවා කොන්දේසි මත කොන්ත්‍රාත් පදනමින් වහ වහා තනතුරුවල ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| SaliyaT/ 150320 25/04 | අධිකරණ අමාත්‍යාංශය යටතේ සෘජුව බලාත්මකව පවතින රාජකාරි | බී වාර්තා සහ තාක්ෂණික දෝෂ හේතුවෙන් ගරු නීතිපති එතුමාගේ කාර්යභාරය ඉහළ ප්‍රමුඛතාවයෙන් දත්ත විශ්ලේෂණය කොට නිවැරදි කිරීමේ ක්‍රමවේද වහ වහා ස්ථාපිත කළ යුතුය. | අති විශාල ලිපිගොනු ප්‍රමාණයක් ආශ්‍රිතව සිදුවන රාජ්‍ය පරිපාලන කටයුතු ඩිජිටල්කරණය කිරීම පිළිබඳව කාලීනව පිළිගත හැකි කිසිදු වැඩ පිළිවෙලක් මේ වන විට ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා විධිවිධාන වහාම ක්‍රියා කරන පරිදි සැලැසිය යුතුය. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මේ සඳහා යෝජනා කැඳවීම පිළිබඳව දැනටමත් පවතින ප්‍රතිපාදන ක්‍රියාත්මක කළ යුතුය. |
| SaliyaT/ 150320 25/05 | විදේශ ප්‍රතිපත්තිය සමඟ ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රතිබන්ධනය වීම | ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කරුණු සහ මහජනතාව චන්දය ලබා දුන් අභිප්‍රායන් නැවත සලකා බැලිය යුතුය. | අමාත්‍ය මණ්ඩලය තම තමන්ට හැකි අයුරින් නිලධාරීන් සමග සාම්ප්‍රදායික රාජකාරී වල යෙදෙන බවක් පෙනී යන අතර මෙකී ඉලක්ක ඉටු කරවීමේ කාලවකවානු සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද පුළුල් විද්‍යාත්මක විසඳුමක් සමග ප්‍රතිබන්ධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| SaliyaT/ 150320 25/06 | යෝජිත තාක්ෂණ ඉලක්ක රාජ්‍ය පරිපාලන ක්‍රමවේද කාර්යක්ෂමව සහ ඵලදායීතාවය වර්ධනය කිරීම | නිලධාරීන් සම්ප්‍රදායික ක්‍රමවේද තුළ රාජකාරී ඉටු කරන බවක් පෙනේ. | සම්ප්‍රදායී රාජකාරී ක්‍රමවේද තුළ කාර්යක්ෂමතාවය සහ ඵලදායිකත්වය කිසිසේත්ම බලාපොරොත්තු විය නොහැක. දැනට සිදුවන්නේ මෙයයි. |
| SaliyaT/ 150320 25/07 | දැනට පවතින සමාජයීය ප්‍රශ්න, ඒ හා ප්‍රතිබන්ධනය වන විසඳුම්, මහජන පැමිණිලි, යෝජනා, නිර්නාමික පැමිණිලි, දුක් ගැන විලි කිසිවක් කාර්යක්ෂමව භාර ගැනීමක්, ප්‍රතිපිළිතුරු ලබා දීමක්, සහන සැලසීමක් හෝ ප්‍රශස්ත මට්ටමේ යෝජිත සංවර්ධනයක් නිරීක්ෂණය නොවන බව බහුතර විද්වත් මතයයි | නිකරුණේ මුදල් වියදම් කොට කාලය නාස්ති කරමින් විධිමත් සමීක්ෂණ නැවත අත්‍යවශ්‍ය නොවන බව සමාජය තුළ දරණ මත තුළ විද්‍යාමාන වේ. | මැතිවරණ වලදී ඡන්දය ලබා දුන් සහ ලබා නොදුන් පදනමෙන් බාහිරව දත්ත විශ්ලේෂණය කොට බැලීමේදී ලාංකික ජනතාව රජය කෙරෙහි ඇත්තේ නොසතුටකි. නමුත් තවම බලාපොරොත්තු නැති කරගෙන නැත. තාක්ෂණික මෙවලම් රහිතව පුළුල් විද්‍යාත්මක විසඳුම් නොමැතිව මෙම තත්ත්වය පාලනය කළ නොහැක. |

Prof SW & Team